SCRIPT



a play about love in 13 letters

# Love & Other Objects

written by

**13 ARTISTS**

compiled by

**JAYAMPATHI GURUGE**

**(devised with the cast)**

stages theatre group

All rights reserved. No part of this publication may be reproduced, stored in a retrieval system, or in any from or by any means, without the prior permission in writing of the publisher, nor be otherwise circulated in any form of binding or cover other than that in which it is published and without a similar condition including this condition being imposed on the subsequent publisher.

*Performing rights for amateur performances will be enquired at:*
*info@stages.lk*

**Love and Other Objects**
First public performance 2018
A Stages Theatre Group presentation

First published (online) 2020
© 2020 Stages Theatre Group
ISBN - 978-624-5487-16-5

Script Content and Layout – Dinushika Seneviratne and Piumi Wijesundara
Cover Design – Prasad Aluthwattha
Cover Photograph – Prauda Buwaneka


© 2020 Stages Theatre Group

# Love & Other Objects

**ආදරය ගැන ලිපි 13ක්**

**ලිපි 13කින් කියවෙන ආදරය ගැන නාට්‍යයක්**

**රචනය**

**කලාකරුවන් 13දෙනෙක්**

සම්පාදනය

ජයම්පති ගුරුගේ

ස්ටේජස් නාට්‍ය කණ්ඩායමේ ඉදිරිපත් කිරීමක්

පළමු දර්ශනය,

කොළඹ, ශ්‍රී ලංකාව, නොවැම්බර් 2018

ජර්මානු සංස්කෘතික ආයතනය.



© 2020 Stages Theatre Group

## *Love & Other Objects* ආරම්භය

*Love and Other Objects* ආදරය පිළිබඳ නාට්‍යයක්

ස්ටේජස් නාට්‍ය කණ්ඩායම කාලයක් පුරාවට තමන් ළඟ එකතු වී තිබෙන ප්‍රයෝගික සහ න්‍යායාත්මක අත්දැකීම් තවත් පිරිසක් සමඟ බෙදාගැනීමේ අරමුණින් සති පහළොවක (2018 මැයි 18 සිට අගෝස්තු 31 දක්වා) නාට්‍ය වැඩමුළුවක් පැවැත්විය. *Love and Other Objects* එම නාට්‍ය වැඩමුළුවට සහභාගී වූ පිරිස සමඟ කළ නාට්‍ය නිර්මාණයයි.

මෙය ස්ටේජස් නාට්‍ය කණ්ඩායම විසින් නිෂ්පාදනය කළ ස්වතන්ත්‍ර නාට්‍ය නිෂ්පාදනයකි.

සත්‍ය අත්දැකීම් පාදක කර ගනිමින් ආදරය සම්බන්ධ මතකයන් සහ අත්දැකීම් පිළිබඳ ආදර ලියුම් එකතුවක් අතුරින් ලියුම් කිහිපයක් තෝරාගෙන, එම ලියුම්වල අන්තර්ගත යම් සංස්කරණයකට යටත්ව *Love and Other Objects* නාට්‍ය පිටපත සකස් කරගනු ලැබීය. එම පිටපත සිංහල සහ ඉංග්‍රීසි බසින් ඩිවයිසින් ක්‍රමවේදය භාවිතා කරමින් නාට්‍ය නිෂ්පාදනයක් ලෙස මාස තුනක පමණ ඩිවයිසින් සහ පුහුණුවීම් ක්‍රියාවලියකින් අනතුරුව 2018 නොවැම්බර් මස 8 සහ 9 යන දිනයන්හී ශ්‍රී ලංකා ජර්මානු සංස්කෘතික ආයතනයේ නිදහස් අවකාශය තුළ Love and Other Objects රංගගත කෙරිණි. සම්මත ප්‍රෝසීනියම් නාට්‍ය ආකෘතියෙන් ඔබ්බට ගිය නාට්‍ය නිෂ්පාදනයක් ලෙස *Love and Other Objects* හැඳින්විය හැකිය. ප්‍රේක්ෂකයන් මෙන්ම රංගන ශිල්පීන්ද එකම තලයක සිට ආදරය පිළිබඳ ඇතිකරගත් සාකච්ඡාවක ස්වරූපයක් නිෂ්පාදනය තුළ ගැබ්ව තිබීම නිසා බෝහෝ ප්‍රේක්ශකයින්ගේ ප්‍රශංසාය මෙම නට්‍ය නිෂ්පාදනයට ලැබිණි.

*Love and Other Objects* ආදරය පිළිබඳව කුඩා ප්‍රේක්ෂක පිරිසකට ආදර ලිපි 13ක් හරහා ආමන්ත්‍රණය කරන පැය දෙකක් පුරා දිවෙන නාට්‍ය නිෂ්පාදනයකි.



© 2020 Stages Theatre Group

# ලිපි

1. **තක්කඩි පෙම්වතා**
2. **To my Ex - Lover ( මගේ පැරණි පෙම්වතියට)**
3. **මට ඔයාව එපා**
4. **මගේ බබී**
5. **Let me read it… (මට මේක කියවන්න දෙන්න)**
6. **මට 17යි එයාට 30යි.**
7. **මට පොඩි ලෙඩක් තියනවා.**
8. **මට මහන්සියි මැණික**
9. **අපිට කවුරුත් මොකුත් කියන එකක් නෑ නේද ?**
10. **මොනවද මම ඔයා වෙනුවෙන් කරේ?**
11. **Sorry. (සමාවෙන්න)**
12. **Problem one (ප්රශ්න අංක එක)**
13. **ඇති.. ඇති.. ඇති..**



© 2020 Stages Theatre Group

# 1 වන ලිපිය

# තක්කඩි පෙම්වතා

මට තේරෙන්නේ නෑ බං උඹයි මගෙයි මේ මගුල. කවදා වෙනකන් මේක මේ විදිහට කරගෙන යන්නද? මොහොතින් මොහොත වෙනස් වෙනවා. උඹ අතාරිනකොට මම අල්ලගෙන. එක්කෝ මම අත අරිනකොට උඹ අල්ලගෙන. දෙන්නම එකට ඇලිලා ඉන්න කාලේ හරිම අඩුයි. ඒ තරමටම උඹෙයි මගෙයි රණ්ඩු. හැබැයි ඒ ආදරේ කරපු පොඩි මොහොතවල් වලට මම හරි ආදරෙයි බං. ජීවත් වෙනව වගේ දැනෙනව ඒවා මතක් වෙනකොට. අපිට අපිව අත ඇරගන්න බෑ. කොහොම හරි එල්ලිලා ඉන්නමයි හදන්නේ. අපි දෙන්නා මොනවද ඇත්තටම අපි දෙන්නගෙන් බලාපොරොත්තු වෙන්නේ. මම ඒ ගැන කල්පනා කරලා තියනවා අපි දෙන්නා කෙළවෙන්න රණ්ඩු කරගත්ත වෙලවට. මට තේරෙන්නේ නෑ. උඹටයි මටයි දැන් මේක සාමන්‍ය දෙයක්. අපි දෙන්නගෙම කාලේ මේ නැතිවෙන්නේ. මේක ආදරයක්ද? නැත්තම් කෑදරයක්ද?. ඒත් උඹගෙයි මගෙයි මොකකට කෑදරකම් කරන්නද? වෙන උන්ට තියෙන්නෙ එකතු වෙන්න බැරි බාහිර ප්‍රශ්න. ගෙවල්වල, නෑදෑයන්ගේ, හඳහන් මනස්ගාත. උඹයි මායි, උඹවයි මාවයි ගලපගන්න හදනවා කාලයක් තිස්සෙ. අපි දෙන්නා තාමත් එකම තැන. පටන්ගත්තු මුල්ම කාලේ වගේ. කෙන්ති ආවහම පොඩි කාලේ ආදරේ කරන උන් වගේ phone පොළොවෙවේ ගහනවා. ගිරිය යටින් කෑගහනවා. වටේ තියන ඒවට හයියෙන් ගහනවා. ඒත් උඹට මතකද එහෙම දවස්වල තව පොඩ්ඩෙන් අපි දෙන්නා පැණි බේරෙන්න love. අනේ මන්දා බං. මට තෙරෙන්නෙ නෑ මේ මගුල. ආදරෙයි උඹට ගොඩාරියක්.

මිට

තක්කඩි පෙම්වතා.



© 2020 Stages Theatre Group

**කියවීම :** **ගිමන්ත වෙලගෙදර**

**ඉදිරිපත්කිරීම :** **කාංචනා මල්ෂානි**

**පැතුම් ධර්මරත්න**



© 2020 Stages Theatre Group

# 2 වන ලිපිය

## To My Ex - Lover

## මගේ පැරණි පෙම්වතියට

Thank you!!!

Kanchana… Pathum ……

Thank you very much…

And Gimantha, that's the voice……

So, very good evening to you all my friends…

It's so lovely to have you all here

To share this evening with us...

ජයම්පති අපිට දැන් පටන්ගන්න පුළුවන් නේ?.... පාලි හරි නේ?....

Ok guys….

First let's sit and settle…

Over there…

Come please ……

කැමති කෙනෙකුට කැමති තැනක ඉදගන්න පුළුවන්.

කැමති කෙනක් එක්ක කැමති විදියට.

මම නම් කැමතියි බිම ඉදගන්න.

*Let the audience settle.*

Hey guys what is this come closer. I want you to hear me properly. And I want to see you properly…

Ok let's have a good breath. This evening is nice. I known it's been little bit rainy. But it's nice. Isn't it?

Ok. Why are we here? Actually what am I doing here?

I do remember six months back, I was tired with my office work. So I need a break. I sign up for a theatre workshop. I do remember the poster my friend shared with me on fb.



© 2020 Stages Theatre Group

රුවන්ති ද චිකේරා මෙහෙයවන නාට්‍ය වැඩමුළුව

Senior Ensemble workshop by Stages Theater Group

'Theatre' really? You might be wondering….

Is this theater? Definitely not...

මේක කිසිසේත්ම නාට්‍යයක් නෙමෙයි.

එහෙනම්?

මේකනේ වුනේ

Workshop එක පටන් අරන් ටික කාලෙකින් රුවා ගියා රුවන්ඩා. එයාගේ වෙන නාට්‍යක් අරගෙන. මං හිතන්නේ එතනින් පස්සේ තමයි මේක වෙනස් වුනේ. නැද්ද?

ඊට පස්සේ ජයම්පතියි, අපියි වැඩේ කරගෙන ගියා.

අපි කෑවා.. බිව්වා... නැටුවා... නෑවා..

ගොඩක් කතා කළා

වැඩත් ටිකක් කළා

Workshop එකේ වැඩ ටික ඉවර කරලා මොකක් හරි කරමු කිය කියා ඉන්න කොට අපි ඉස්සරහට ආවේ LOVE. මම හිතන්නේ ඉතින් ඒක එහෙම වුනා.

So we talked and talked of love. Not only love but also other objects engaged in the process with love. We went through gifts. Memories. Long long chat heads. And love letters.Oh yeah, we collected and wrote love letters. Wrote and re wrote many love letters. I selected a letter I wrote to my Ex at the beginning of this writing exercise. Jam shall I….?

*Proceed to read letter.*

*2018/09/03 කොළඹ දී,*

*Dear N,*

*මෙක පරණ මලමයි. හැබැයි එක පෙත්තක් වැඩියි. ඔයාට ඉස්සර ලියපු ලියුම්වල හැම එකක්ම වගේ පටන් ගත්තේ පස්පෙති මලකින්. ඊට පස්සෙ දිනය. ඊට පස්සෙ මම ලියනවා, ආදරණීය N මම මේක ඔයාට ලියන පළවෙනි ලියුම නෙවෙයි. ඔයාට මතකද*



© 2020 Stages Theatre Group

*මේක 87 වෙනි එක? ඒ වගේ ලියුම් ගොඩකට පස්සෙ මම ඔයාට ලියන එක නතර කරා. අපි හම්බෙන එකත් නතර උනා. අපේ ජීවිත හෙමීට හෙමීට වෙනස් වුනා. හැබැයි මට හිතෙනවා මම මේ දවස්වල ඉන්වොල්ව් වෙලා ඉන්න වැඩක් එක්ක ඒ ලියුම් ආපහු අදින්න කාලේ ඇවිත් කියලා. මගෙ ගෙදර අල්මාරියේ පරිස්සම් ඇති තැනක ඒ ටික ඇති. ඒවත් අරගෙන මේ weekend එකේ මම ඔයාලගේ ගෙදර එන්නම්. ඔයා මට දීපු, මම ඔයාට දීපු, ලියපු දේවල් අපි ආපහු කියව ගමු. වෙන වෙන වැඩක් දාගන්න එපා. කැමතිනම් Gටත් ඉන්න කියන්න. හැබැයි ඔයාට ඕනනම් විතරක්. N මට ඇත්තටම මේ ඉඩ ඕන. මම දන්නවා ඔයා මට ඒක මට දෙයි. හැබැයි එක දෙයක්. එදාට උයන්නේ මම.*

*මම ඔයාගේ පරණ ආදරවන්තයා M.*

ඔව් මචං

උඹ කිව්වා මේක එයාට දෙන්න එපා කියල

හැබැයි මං ඒ වීක් එන්ඩ් එකේ එයාගේ ගෙදර ගියා

ලියුමත් දුන්නා

උඹ කිව්වේ එයා ඒක ගන්නේ නැති වෙයි කියල

එයා ඒක ගත්ත

ඒත් උඹ හරි, එයා අද ආවේ නෑ

සමහර විට හෙට එන එකකුත් නෑ

කමක් නෑ

ඉතින් අපි මේ කරන්න යන්නේ

ලියුම් කියවන එක

We are going to read few letters.

Letters of love

ආදරයක් ගැන හිතෙද්දි

ආදරේ කරද්දී

ආදරේ කරන එක නවත්තද්දී



© 2020 Stages Theatre Group

එක එක අය ලියපු ලියුම්.

වැඩි හරියක්

ලැබිය යුතු අයට තවමත් නොලැබුන ලියුම්, සමහර විට කවදාවත් නොලැබෙන ලියුම්. සමහර විට ඔයා හිතන ලියුම මේ ලියුම් අතර නැතුව ඇති. හැබැයි අපි ආසයි ඒකත් අහන්න. ඔයා කැමති නම්. ප්ලීස් හිතුනොත් කතා කරන්න. මතක් කරන්න. හිනාවෙන්න. අඬන්න.

මම හිතන්නේ මම ගොඩක් පැටලුවේ නෑ.

මම දන්නවා පැටලෙන්න තරම් දෙයක් මෙතන නෑ

මේක නිකන් විහිළුවට වගේ ලියපු ලියුමක් විතරයි....

හැබැයි.. මේවා කියවද්දී පැටලුනොත් පැටලෙන්න දෙමු.

මොකද යන කොට ලෙහා ගෙන යන්න බැරියැ. වෙලාව තියනවනේ.

පාලි මට ඕනේ අර සින්දුව මචං.

'ඉස්සර මං ළඟ'

**කියවීම : රජිත මධුභාෂ**



© 2020 Stages Theatre Group

## 3 වන ලිපිය

## මට ඔයාව එපා

Thanks

මට එයා ගැන කියන්න අවස්ථාවක් දුන්නට..

ඔයා දන්නවද ඇයි මම ඔයා ගැන ලියන්නේ කියලා..

එතකොට මට පහසුයි.. හිරකරගෙන ඉන්න දෙයක් නෑ..

නැත්තම් අමාරු වෙයි ..

ඔයාට ලස්සන හිනාවක් තියනවා..

උඹ නිකන් ඉන්න වෙලාවට නම් මෙලෝ රහක් නෑ...

ඔයා මගේ ජීවිතට භාවනාවක් වෙන්න පටන් අරගෙන..

දන්නෙම නැතුව මම නිවන් දකියි..

ඉතින් කොහොම හරි මේ දුක අඩු කරගන්න එක තමයි වැඩේ දැන්.

මම හරි කැමතියි අප්පා ඔයත් එක්ක කාලේ කන්න..

කොහොමද කිසිම දෙයක් දැනෙන්නේ නැ වගේ ඉන්නේ..?

Thanks. අදත් ඔයා නිසා පොඩ්ඩක් රිදුනා..

මට ඔයාව එපා..

මෙහෙම ඉමු..

මට නපුරු මිනිස්සු මුණගැහිලා තියනවා..

උඹ වගේ කෙනෙක් මුණගැහිලා නෑ.



© 2020 Stages Theatre Group

මම ඔයා ගැන වද වෙනවා ..

ඔයාට වදයක් වෙන තරමටම..

මම කැමතියි ඔයාට ලියුමක් ලියන්න..

මට ඔයාට kiss කරන්න හිතුනා…

තුරුල් කරගෙන නිදාගන්න හිතෙනවා..

ඔලුව අතගාන්න...

මම කැමතියි ඔයා දිහා බලාගෙන ඉන්න..

හරිම බොළඳයි මේ කතා..

ඔයාගේ ඇස්..නිදි මතෙන් බරවෙලා..

එතකොට හරිම අහිංසකයි..

මුණේ අහිංසක හිනාවක් තියනවා..

බාගෙට පිය වුන ඇස්...

බාගෙට ඇරුණ කට..

නොයිවසිල්ලෙන් බලාගෙන ඉන්න ඇඟිලි තුඩක් මුණේ කොනක දුවනවා....

තෙල් මතු වුන සම..

සිංදු මුමුණන දෙතොල්..

ඔයා නිසා අවදියෙන් ඉන්න මම..

ඔයා දිහා බලාගෙන ලියන නොගැලපෙන වැකි..

මේ හැම මොහොතක්ම මතකයක් විතරක් වෙයි..

සමහරක් මොහොතවල් අමතක වෙලා යයි..

එත් අපි ඒ මොහොත ගත කරලා..

ඉඳලා හිටලා මම ඔයා දිහා බලාගෙන ඉඳලා හිනා වෙනවනම් ඒ මට උඹ ගැන ගොඩක් ආදරේ හිතිලා..

පුසෙක් වගේ පහුරු ගානවානම් ඒත් ඒහෙමයි..

මොනවා හරි කියන්න ගිහින් නවත්තනවානම් එත් එහෙමයි..

ඔයාට මොකුත්ම නොකර ඉන්නවනම් එත් ඒ නිසාම වෙන්න ඇති..



© 2020 Stages Theatre Group

හරිම බොළඳයි..

මේ ටික කියන්න දවසක් එයි..

සමහරක් විට..

සමහරක් විට එන එකක් නෑ..

මම මේ ලියන දේවල් නැවත හදන්නේ නෑ..

කවද හරි ඔයාට කියවන්න දෙයි..

එත් සමහරක් විට...

ඔයාව මගේ ළඟ තියාගන්න බලාගෙන නෙවෙයි..

මම බලාගෙන ඉන්න එපාද?

හැමෝම දන්නවා..

හැමෝටම දැනෙනවා..

අපි දෙන්නත් දන්නවා..

දන්නේ නෑ වගේ ඉන්නවා..

**කියවීම : පැතුම් ධර්මරත්න**



© 2020 Stages Theatre Group

# 4 වෙනි ලිපිය
# මගේ බබි...

2011.11.10

බුදු සරණයි මගේ රත්තරනේ.
මගේ රත්තරනේ හොඳින් නේද? මගේ බබී හොඳින් ඉන්න නිසා, මාත් හොඳින්. මගේ බබී දුකින්නම් මාත් දුකින්... ඇයි මගේ බබී එදා බස් එකේදී ඇඬුවේ? බබිගේ යාළුවා කිව්වා මම දුකින් ඉන්න නිසයි මගේ බබි ඇඬුවේ කියලා. මං දන්නවා බබී, මගේ බබී මට ගොඩාක් ආදරෙයි කියලා. මගේ රත්තරන්ට වෙන කොල්ලෝ ඕනේ නැහැ. වෙන කාවවත් බඳින්නේ නැහැ. කවදාහරි මං ගාවට එනවා කියලා මම දන්නවා වස්තුවේ. බබීත් මං ගැන දන්නවා නේද? මාව විශ්වාස කරන්න වස්තුව. මම කවදාහරි මගේ බබීව මං ගාවට ගන්නවා. ඒකට තව වැඩි කාලයක් නැහැ.

අපි දෙන්නා ගැන ආරංචි ආයේ අම්මට යන එකක් නැහැ දෙයියෝ. අපේම ළඟ ඉන්න අයගෙන් තමයි බබී ආරංචී වෙන්නේ. එදා අම්මා ගැහුවා නේද? මගේ බබීට රිදුනද ගොඩාක්? මාත් ඒ වේදනාව විඳිනවා බබී සත්තයි. මායි මගේ රත්තරනුයි දැන් දුරදිග හිතලා තීරණ ගන්න ඕනේ. පොඩි ළමයි වගේ හැඟීම්වලට යට වෙලා තීරණ ගන්න හොඳ නැහැ බබී. මොකද මගේ බබීට O/L විභාගෙට තව අවුරුදු 2යි තියෙන්නේ. මටත් තව අවුරුද්දයිනේ බබී. O/L විභාගේ මායි මගේ බබී හොඳට පාස් වුනොත් අපිට ආයේ කාගෙන්වත් දොස් නැහැ දෙයියෝ. ෆේල් වුනොත් මට හැමෝම බනී. මූ හින්දා තමයි මේ ළමයා ෆේල් වුනේ. මේ යකා නිසයි මගේ ළමයට මෙහෙම වුනේ කියලා. මම දන්නවා මගේ බබී මට එහෙම අහන්න දෙන්නේ නැහැ කියලා. මගේ බබී මට A 10 අරන් දෙනවා කියලා මම දන්නවා. මට එක විශ්වාසයි. හැමදාම මං ගාවට වෙලා මාව දිරිගන්වන්න ඕනේ. හැබැයි ඔහොම හිටියොත් මටත් කණු, බබීටත් කණු හොඳේ. ඒ නිසා හැමදාම පාඩම් කරනවා කියලා පොරොන්දු වෙන්න බබී.



© 2020 Stages Theatre Group

මායි, බබීයි විභාගේ හොඳට පාස් වෙලා හොඳ තැනකට එමු. මම අර බබීට දුන්න පොඩි ගේ, ඒ ගේ වගේ ගෙයක් හදලා මගේ අම්මවයි, තාත්තවයි, බබීගේ අම්මවයි, තාත්තවයි හොඳට බලාගෙන ලස්සනට ජීවත් වෙමු මගෙ දෙයියෝ. මං මේක එක්ක මගේ බෙල්ලේ තිබ්බ මාලේ එවනවා. බබී ඒක දාගන්න. එතකොට මගේ බබීට දැනෙයි මම ළඟින් ඉන්නවා කියලා.

හැමදාම තුන්වේලටම කන්න ඕනේ බබී. බෙහෙත් බොන්න.හොඳට පාඩම් කරන්න මගේ මැණික. රෑ වෙනකල් පාඩම් කරන්න එපා. මගේ බබී මාව මතක් වුනොත් මං දුන්න මාලේ අල්ලන්න බබී. මම මගේ බබී ගාව. මට පොරොන්දු වුණු හැමදේම කරන්න බබී. හෙට මේකට උත්තරයක් එවන්න බබී. මං බලන් ඉන්නවා. පරිස්සමින් ඉන්න මගේ දෙයියෝ. බුදු සරණයි.

I LOVE U මගේ රත්තරං

I LOVE U TOO මගේ දෙයියෝ

I LOVE U SOOOOOO much මගේ බබී

U m m m m m m m m m m m m m m m m m m m m m m a

දැන් ගෙදර තත්වේ කොහොමද මැණික? අම්මා බැන්නද? තාත්තා බැන්නද? මට හැමදේම ලියලා එවන්න පණ. මං බලන් ඉන්නවා බබී. එදා උඩ තට්ටුවේදි මං දිහා බැලුවේ නැති වුණාට මට දුක හිතුණා බබී. බබී දැක්කේ නැහැ නේද මාව? අයේ එහෙම කරන්න එපා වස්තු. ගොඩාක් ආදරෙයි.

ගොඩාඩාඩාඩාඩාඩාඩාඩාඩාඩාඩාඩාඩාඩාඩාඩාඩාඩාඩාඩාඩාඩාඩාක් ආදරෙයි. බුදු සරණයි පණ.

මේ ඔයාගෙම... ඔයාගෙම... ඔයාගෙම... ඔයාගෙම රත්තරං ඒ අයියා........

**කියවීම : අෂාන් ලක්ශාන්**



© 2020 Stages Theatre Group

## 5 වන ලිපිය

### Let Me Read It...

### මට මේක කියවන්න දෙන්න

Can I sit here?
මේක මට ඇහෙන්න කියවන්න.

*ප්රේක්ෂකයෙකුට ලිපිය දෙයි. ප්රේක්ෂකයා ලිපිය කියවීමට සැරසෙයි. නැවත ලිපිය ලබා ගනියි.*

Let me read it.
I always knew something like this might happen. I just didn't know when. I certainly didn't know it would happen at a moment like this. Can I hold your hand? I…..I like you.
මම ඔයා දිහා බලන් ඉදලා තියෙනවා.

The way you act. Way you came here. Way you treat people. Way you smile.
මම පිස්සු කෙලින වෙලාවට මම බලන් ඉදලා තියෙනවා ඈතට වෙලා. මම හරි ආසයි ඒවට. මට කියන්න බැරි හින්දා මම ලියනවා. එක ලේසියි. මම ඔයාව අපහාසුතාවයට පත් කරන්නේ නැහැ නේද?

There were certain points in my life where I was confused. As I'm sure you were. I don't know, were you? But for me... You are so confident. Sometimes I wish… I wish I had your confidence.
ඒ කියන්නේ ඔයාට ඕන මොහොතක ඔයාට ඕන දේ කියන්න පුළුවන් ශක්තිය, මට තියෙනවා නම්. මට ආදරේ හිතෙන හිතෙන වෙලාවට මට ආදරෙයි කියලා



© 2020 Stages Theatre Group

කියන්න පුළුවන් නම්. මේ ඔක්කෝම ඉස්සරහා. එක ඒ විදියට බාර ගන්නවා නම්. මම කැමතියි ඒ හයිය මටත් තියෙනවා නම්.

I think I don't need that confidence. I really don't need that confidence. I have you...

Thank you, මට මේ ඉඩ දුන්නට. මේ ස්පේස් එක දුන්නට මේක කියන්න. මට ආයේ ලියන්න ඕන වෙන එකක් නැහැ.

Thank you....

මේක තියාගන්න *(ලිපිය ප්රේක්ෂකයා අතට දෙයි)*

මම ඔයාව අපහසුතාවයට පත් කරන්නේ නැහැනේ?

**කියවීම : නිපුනි ශාරදා**



© 2020 Stages Theatre Group

## 6 වන ලිපිය

## මට 17යි. එයාට 30යි

මට 17යි. එයාට 30යි. මිනිස්සු හැමොම අපිව දන්නවා. අපි වටේ ඉන්න හැමොම අපිව සැක කරනවා. එයාලට තියෙන ලොකුම ප්රශ්නේ අපි love කරනවද කියන එක නෙවෙයි. අපි sex කරනවද කියන එක. මගේ යාලුවෝ කෙලින්ම අහන්නේ නැතුව වටෙන් වටෙන් මගෙන් අහනවා මොකක්ද බං උබලා අතර ඔය තියෙන්නෙ කියලා. සමහරක් විට එයාගේ යාලුවොත් අහන්නවා ඇති. මිනිස්සුන්ට අපිව ප්රශ්නයක් වෙලා. Love කරන්න වයස ගැලපෙන්න ඕන කියලා ලොකේ කොහෙවත් කියලා තියනවද? නැනේ... එහෙනම් ඇයි මිනිස්සුන්ට අපිව ප්රශ්නයක් වෙලා තියෙන්නේ අපිව?

මිස්, මතකද මම ඔයාට පළවෙනියට ආදරෙයි කියපු දවස. අර අපි වතුර බොන තැන. පැය ගානක් කතා කරනවා. අපි දෙන්නා දැනගෙන හිටියා අපි අතර මොකක් හරි දෙයක් ගොඩනගෙන්න යනවා කියලා. ඔයාට මුලින්ම ඒක දැනගන්න ඕන වුනා. මම දන්නවා ඔයා අහන්නේ මොකද කියලා. මම කතන්දර ගොඩක් කියලා කියලා අන්තිමට කිවුවා 'මිස් මම ඔයාට ආදරෙයි' කියලා. ඔයාට කලින් ඒක පටන් අරගෙන ගොඩක් කල්. එතකොට එයා එහෙම කිවුවා. ඇයි මම මේ පරණ දෙවල් ලියන්නේ. ගණන් ගන්න එපා. මම තාම පොඩි එකානේ. ඊටපස්සේ අපි ආදරවන්තයො වුනා.

මිස් මතකද ඔයා මට ඉගැන්නුවා දර්ශනික ආදරවන්තයෙක් වෙන්න කරන්න ඕන දේවල්. වැදගත්ම දේ අපිට කතා කරන්න දේවල් තිබුණා. Msg කරා. ලිවුවා, බිවුවා. කවුරුවත් නැති තැන්වල meet වුනා. දුර බස්වල ගියා. රෑ එළිය වැටෙනකන් කතා කරා. අන්තිමට ඉස්කොලෙදි නින්ද ගිහින් එයාගෙන්ම ටොකුත් කැවා. අපිව දන්න, අපිව විශ්වාස කරන යාලුවො එයාලගේ ගෙවල්වල යතුරුත් දිලා තිබුනා. මතකද දවසක් office එක ළගදි අතින් අල්ලලා වෙච්ච දේ. කවුරුත් අපිව විශ්වාස නොකර ඉද්දි අපි



© 2020 Stages Theatre Group

අපිවම විශ්වාස කරා. කාටවත් කරදරයක් නොවෙන්න අපි අපිටම ගැලපෙන විදිහක් හොය ගත්තා. ඒත් මුලු ලෝකෙටම අපිව ප්රශ්නයක්.

මම තාම පොඩියි. මගේ අතින් වැරදි වෙනවා. දැන හෝ නොදැන. හැබැයි මම හිතනවා අපි ආදරේ කරනවා. අපි දෙන්නම ඒක දන්නවා. අපි දෙන්නම ඒක විශ්වාස කරනවා. මමත් කැමතියි අප්පා ප්රසිද්දියේ love කරන්න. අපි ඉන්න තිබුනේ ප්රංශේ. එහෙම වුනානම් අපිට තිබුනා ලෝකෙටම පේන්න ආදරේ කරන්න. මම නිකන් අහන්නේ. ඉතින් අපි ආයේ කවදද හම්බෙන්නේ. ගෙදරට කියන්න පුලුවන්. දවස් දෙක තුනකට එළියට යන්න පුලුවන්, මිනිස්සුන්ට විස්වාස කරන්න පුලුවන් බොරුවක් හදාගන්නත් ඒපෑ. ආයෙ වැස්සේ තෙමෙන්න, තුරුල්වෙලා ඉන්න, කතන්දර කියන්න, ඔයා මට උගන්වපු දේ ඔයාට ආයෙත් උගන්වන්න. Film බලන්න. ඔයාට කියලා ඔළුව අතගාගන්න. තව දෙයක්, ඔයා එනකොට නොට්ස් ටික අරගෙන එන්න. ලබන මාසේ exam. ඒකයි. ඔයා අන්තිමට ලියපු ලියුමෙ තිබුණා "මුලු ලෝකෙටම බොරුවක් වුනු අපි දෙන්න අතරට බොරුවක් ආවොත් අපි දෙන්නම විනාස වෙයි මුලු ලොකෙම ඉස්සරහා. මුලු ලොකෙම කිවුවා වගේ." ඒ ගැන කතා කරන්නත් ඕන.

**කියවීම : පසිඳු හිරන්ය**



© 2020 Stages Theatre Group

# 7 වන ලිපිය

# මට පොඩි ලෙඩක් තියනවා.

මට සමාවෙන්න මං ඔයා ගැන එහෙම හිතුවට.. මා දන්නේ නෑ.. මම හිතුවේ ඔයා ඒක කරන් ඇති කියලා.. මට පොඩි ලෙඩක් තියනවා. මගේ සම්බන්දතා වැඩිකල් පවතින්නේ නෑ.. එකම හේතුව මගේ හිතේ සැකය. සමාවෙන්න මම ආයෙ එහෙම කරන්නේ නෑ. ආයෙ බැල්ලි කියන්නේ නෑ. මට ඕන වුනේ ඒක චෙක් කරන්න විතරයි. මට යාළුවො කිවුවා ඕකි වටේ ගිහින් අරක පතුරු ගහගෙන ඇත්තේ කියලා.. කොහොමද මම ඉන්නේ එහෙම කියනකොට. මම ඔයාටනේ love කරන්නේ. ඔයාමනේ කියලා තියෙන්නේ 100% විශ්වාසෙයි 99% විශ්වාසෙයි අතර වෙනස 1% නෙවෙයි කියල.. මට ඔයාව විශ්වාස නැතුව නෙවෙයි. මම දන්නවා ඔයාටත් මාව සමහරක් තැන්වලදී සැක ඇති.. මම කියන්නේ ඒක තියෙන්න ඕන.. එතකොට තමයි ඕනෑම සම්බන්දයක අයිතියක් දැනෙන්නේ.. ඔය සමහරක් මිනිස්සු කිවුවට සම්බන්දයක් ඇතුලේ අයිතියක් තියාගන්න කැමති නෑ, එයා කැමති කෙනෙක් එක්ක ගිහින් ආවට මට කමක් නෑ, නිදහස තියෙන්නේ ඕන.. බම්බුව.. ඔය මොකා කොහොම කිවුවත් තමන් love කරන මනුස්සයා වෙන කෙනෙක් එක්ක හිටියා කියලා දැනගද්දීම එනවා ඉරිසියාවක්.. ඒක නෑ කියලා කියන්නේ ඉතින් බොරු.. මම කියන්නේ චුට්ටක් හරි එනවා.. මගේ ළඟත් තියනවා තමයි ලොකු ලොකු රැඩිකල් ටෝක්.. ඒ වුනාට ඔයා මට පැටියෝ.. මැණික කියලා msg call කරද්දී මම හිතනවා මේ ගෑණි වටේ ගිහින් මාත් එක්ක බුදු වෙන්න කතා කරනවා කියලා. අනේ මැණික ඒහින්දයි මම හිතුවේ මේක චෙක් කරන්න ඕන කියලා. මම දැන් දන්නවා ඔයා මුලින්ම නිදියලා තියෙන්නේ මාත් එක්ක කියලා.. කවුරු මොනවා කිවුවත්.. මට ඒක අද ඔයා ඔප්පු කරලා පෙන්නුවා.. අපි අතර දැන් ආය ප්රශ්න නෑ. මට සමාවෙන්න.. මේ ඇයි ඔයා මගේ ඇහුවේ කිස් කරන වෙලාවේ ඔයාට හොඳට පුරුදුයි නේද කියලා..



© 2020 Stages Theatre Group

මම ඒවෙලාවේ මොකුත් කිවුවේ නෑ.. මම කැමති නෑ බොරුවට රණ්ඩු කරන.. හැබැයි ඉදලා හිටලා පොඩි හරි රණ්ඩුවක් ඕන.. නැත්තන් සම්බන්දයක් තියනවා කියලා දැනෙන්නේ නැහැ නේ... අද ඉදන් මම ඔයාව පතුරු ගහනවා.. වෙන කාටවත් දෙන්නේ නෑ. මට සමාවෙන්න බැල්ලි කිවුවට. ඔයා දැන් මගේ විතරමයි. වෙන කාගෙවත් ළඟට යන්නවත් බෑ..හොඳද..? මොකෝ දැන් ලේසියිනේ.. එහෙම වුනොත් ආය sorry කියන්නේ නෑ. ඔයාගේ කම්මුල රතුවෙයි මගේ ඇඟිලිවලින්.. මතක තියාගන්න මගේ ලෙඩේ.. ආදරෙයි .. උම්මා..

**කියවීම : දුලංජ දිල්ශාන්**



© 2020 Stages Theatre Group

# 8 වන ලිපිය

# මට මහන්සියි මැණික...

මම හිතන්නේ දැන් අපිට කතා කරන්න කිසිම දෙයක් ඉතුරු වෙලා නෑ බබා.. සමහරක් විට කොහේ හරි තැන් තැන්වල ඉතුරු වුන දේවල් ඇති. ඒ කිසිම දෙයක් මේ වෙනකොට වැදගත් නෑ. ඔයාට ඇහෙන්නේ ඔයාට අහන්න ඕන දේවල් විතරයි. මමත් ඒ වගේම වෙලා. පහුගිය කාලේ වුන හැම දෙයක්ම ඒ මොහොතේ සිදු වුනු ඇත්ත. ඉතින් දැන් ඒක විනිශ්චය කරලා වැඩක් නෑ.. වෙන්න තියෙන හෝ වෙයි කියලා බලාපොරොත්තු නොවුණු දේවල්, කවදාවත් අපි අපේ කටවල්වලින් කියාගන්නේ නැතිවෙයි කියලා විශ්වාස කරපු දේවල් .. කවදාවත් කරන්නේ නෑ කියලා හිතපු දේවල් පවා අපි දෙන්නම අතින් වුනා. ඒවා හරිද වැරදිද කියලා දැන් හොයලා වැඩක් නෑ.. තව දුරටත් මම කිසිම දෙයක් නොකියා ඉන්නම්..

ඇයි මිනිස්සු කසාද බඳින්නේ බබා.. ඇයි දෙන්නෙකුගේ සම්බන්දයක් මැද්දට නීතියක් එකතු කරගන්නේ.. ඒක ඇතුලේ හැම දෙයක්ම බොරු වෙන්න පටන් ගන්නවා.. තමන්ගේ කරගෙන.. අයිතිය ප්රකාශ කරගෙන.. ඇයි බබා අපි දෙන්නගේ විශ්වාසය විතරක් මදි වුනේ.. තව සාක්ෂිකාරයෝ මොකටද..? කෝ දැන් ඒ අය.. කෝ දැන් අර ඉන්නවා කියපු අපේ වටේ හිටපු මිනිස්සු.. ඒ කාටවත් වෙලාවක් නෑ. දැන් මේ වෙන්නේ මොකක්ද කියලා තේරුම් ගන්න.. ඉඳලා හිටලා ඇවිත් උපදෙස් ගෝනියක් දීලා යයි.. ඔයාටත් මේ හැම දෙයක්ම පැහැදිලි ඇති.... බබා මට ඔයාව තවත් රිද්දන්න අමාරුයි. මේ ඇති.. මම කොච්චර ඔයාව රිද්දනවද.. කාලෙකට පස්සේ මම ආයෙත් කෙළින්ම දේවල් කියන්න අරගෙන නේද..? මම දන්නේ නෑ ආදරය කියන්නේ මොකක්ද කියන්න. හැබැයි ඒ අපිට sex කරන්න ඕන වෙලාවට දාගත්තු සීලාචාර වචනේ නෙවෙයි කියන්න විතරක් මම දන්නවා...

අපි දෙන්නටම මේ හැම දෙයක්ම අමාරුවෙන් හරි පිළිගන්න වෙනවා.. මේ සම්බන්දෙ ගනුදෙනුවක් බවට පත් වෙලා.. අපි, අපි වෙනුවෙන් ආදරෙන් කරගත්තුවා, බලෙන් කරන දේවල් බවට පත් වෙලා.. පුංචිම දේවල්වලටත් කළකිරීම් එනවා.. ඔයා මේ හැම



© 2020 Stages Theatre Group

දෙයක්ම දන්නවා.. එත් ඔයා තාම මේ වෙන දේ පිළිගන්න කැමති නෑ.. මට නින්ද යන්නේ නෑ.. කාලයක් යනකන් මම නිදාගත්තේ ඔයාගේ පපුව උඩ. දැන් මට තනියම නිදාගන්න හැටි මතක නෑ.. රෑ එළිය වැටෙනකන් ඔහේ බලාගෙන ඉන්නවා... ඔයාටත් ඒ වගේම ඇති.. අපි කාලයක් එකට හිටපු නිසා අපි අපිට පුරුදු වෙලා.. ඒ සුවඳ.. උණුසුම හොයනවා.. කාලයක් යයි ඒ මතකය මුලු ශරීරයෙන්ම අයින් වෙන්න .. ඒ කාලය අපි දෙන්නටම අමාරු වෙයි. හැබැයි අපි දෙන්නම ඒ කාලය අමාරුවෙන් හරි ගත කරන්න ඕන. නැත්තන් අපි මේ සම්බන්දෙ ඇතුලේ විනාස වෙලා යයි බබා.. අපි සිහින මවපු දරුවෝ අපි වෙනුවෙන් පොලියත් එක්කම වන්දි ගෙවයි. අපි ඒ අය වෙනුවෙන් කිසිම දෙයක් කතා නොකර ඉතාම සාමාන්‍ය මිනිස්සු වගේ හැසිරෙන්න පටන්ගනියි.. ලෝකයක් ඉස්සරහා සතුටින් ඉන්නවා වගේ රඟපාන්න පටන් ගනියි.. අපිට අපිව පෙන්නේ නැති තැනටම පොඩිම වෙලා යයි..

මම කැමති නෑ කවදාවත් ඔයාට වෛර කරන්න.ඉතින් මේ තමයි හොඳම වෙලාව. මට යන්න ඕන.. ඔයාටත් යන්න පුළුවන්.. දෙන්නගෙන් එක්කෙනෙක් පළවෙනි අඩිය තියන්න ඕන. ඔයාද ? මමද? කියලා ආයෙත් තීරණය කරන්න දෙයක් නෑ.. අපි වටේ ඉන්න අයට අපිව ප්රශ්නයක් වෙයි.. ඒ කිසිම දෙයක් ගැන මේ වෙලාවේ හිතන්නේ නැතුව ඉමු. මට මහන්සියි.. ගොඩාක්.. ඉතින් අපි ආයෙත් හම්බෙනකොට හොඳට කතා කරමු.. හැබැයි ටික කාලයක් යනකන් මම ඔයාගෙන් ඈත් වෙලා ඉන්නම්. පුරුද්දට ගිය හැම දෙයක්ම වෙන පුරුද්දකට යනකන්.. නැත්තන් අමාරුවෙයි.. මට.. ඔයාටත්.. ලියලා ඉවර කරන්න බෑ බබා එත් .. දැන් ඇති..හොඳින් ඉන්න...

හිනාවක් ඉනාවක් නැති

කතවක් බහක් නැති

ඔබ තාම ඉන්නවා.

ලතාවක් හිතාවත් නැති

හදක් මෙන් ගැහෙන්නේ නැති



© 2020 Stages Theatre Group

ඔබ තාම ඉන්නවා.

ආදරේ කියන්න... ආදරේ කියන්න... ආදරේ කියන්න

මම ඉන්නේ නෑ

දුර යන්නේ නෑ

**කියවීම : කාංචනා මල්ශානි**



© 2020 Stages Theatre Group

# 9 වන ලිපිය

# අපිට කවුරුත් මොකුත් කියන එකක් නෑ නේද?

ගෑණු දරුවට,

මම තරහ නෑ සුද්දි… සුද්දි බය උනාද? "බය වෙන්න එපා මෙතන කිසි අවුලක් නෑ අපිට". ඒ උනාට මට වැඩිය සද්ද කරන්න බෑ ගෑණු දරුවෝ. මට හයියෙන් අඬන්න බෑ සුද්දි...මට කිසිම දෙයක් මට ඕන විදියට පිටකරගන්න බෑ සුද්දි. සුද්දි දන්නව ඒකට හේතුව. මිනිස්සු ආදරේ කරන්න පටන් ගත්තම ඒ අය කරන දේවල්… අපෝ… සුද්දි මට පළවෙනි ඉඟිය දුන්න දවස මතකද? "ඔය වෙලාවට ආපු හැටි නේ " මතකද මගේ කණ මිරිකලා....

සුද්දිගෙයි මගෙයි ආදරේ හොඳම යාලුවා තමයි කලුවර. සුද්දි දන්නව මම එහෙම කියන්නෙ ඇයි කියල. ඔයා මට ආදරෙයි කිවුවෙත් කලුවරේ, අඩුම තරමේ මට එවෙලෙ සුද්දිගෙ මූණවත් පෙනුනේ නෑ... සුද්දියි මමයි වැඩිපුරම ආදරේ කරෙත් කලුවරේ, සුද්දියි මමයි.......... කලුවරේ, කලුවරයි නේ... සමහරක් විට අපිව කවුරු හරි අඳුරගනී කියලා හිතෙන නිසා වෙන්න ඇති නේද... මොන කලුවරේ උනත්, සුද්දියි මමයි හුඟාක් අසරණයි... හැබැයි... නෑ නෑ සුද්දි, සුද්දිගෙ බය ගැන මට අදහසක් තියනවා. හැබැයි මම මොකටද සුද්දි කාටවත් බය වෙන්නේ... මම බය සුද්දිගෙ බයට. ඔයා... සොරි, සුද්දි බයෙන් ඉන්නවට මම කැමති නෑ. සුද්දි වැරදි නෑ... අපි වැරදි නෑ සුද්දි... නෑ නෑ... මම වැරදියි සුද්දි. මට තිබුන තව අවුරුදු තුනක් ඉස්සරවෙන්න......

කොළඹ ඉදල පැය පහක ගමනක් යන ඒ රෑ බස් එක තරං සුවපහසු ආදරණීය තැනක් මේ ලෝකෙ වෙන කොහෙවත් නෑ සුද්දි. ඒ හැමෝගෙම ඇස්වලින් ගැලවිලා සුද්දියි මමයි අඩ අඳුරේ, පෙබරවාරි හීතලේ, මහ පාන්දර, පොඩි හිඩසක්වත් නැති තරමට තුරුල්වෙලා....හ්ම්.....අනේ... ඒ ... ගමන....කොළඹ ඉදලා ඒ උණුහුම විදගන්න, පැය පහක් මම එනවා හීතලේ. සුද්දි හරි ලස්සන ගමනක් ඒක... කෙළපෙරන, නිදි කිරන, ගොරවන මිනිස්සු රොත්තක් අස්සේ, උදේ පිපිණු මලක් වගේ ඉලන්දාරියෙක් ගමන



© 2020 Stages Theatre Group

පුරා නොනිදා ඇවිත්, පාන්දර 2.15ට සුද්දිගෙ මැසේජ් එක ආවම, මම මවුත් වොශ් එකෙන් කට හෝදල, වෙට් ටිශූ එකකින් මූණ අතපය පිහිදගෙන., අලුත් ටී ශර්ට් එකත් දාගන්නවා බස් එක ඇතුළෙම, හරියට දළදා මාලිගාවෙ කරඬුව ගෙනියන ඇතා ඒකට පේවෙනව වගේ, මමත් සුද්දි වෙනුවෙන් පේවෙනවා.... පාන්දර 3.15ට බස් එකෙන් බහින මම දකින පළවෙනි දේ... මගේ සුරංගනාවී හිම උඩින් පාවෙලා ඇවිත්, ඇස් කොණකින් ආදරේ දීලා. බස් එකට නගින ඒ පණ තියන පින්තූරේ... කවදාවත් ආදරේ නම් දශමෙකින්වත් අඩුවෙලා නෑ. සුද්දි මම දන්නව ඒක...සුද්දිත් දන්නව ඇති.

මම කතා කරන්න කැමති නැති ඒ මාතෘකාව...ඔයාව නිතරම හම්බවෙන්න බැරි නිසා සුද්දි ඔයා ඔන්ලයින් ඉන්නව දැක දැක මට සුද්දිට ටෙක්ස්ට් එකක් දාන්න බැරිවීම... මම දන්නෙ නෑ සුද්දිගෙ අකවුන්ට් එක පාවිච්චි කරන්නෙ සුද්දිද නැත්තන්.... සුද්දිගෙ කට හඬ අහන්න කෝල් එකක් අරන්...කිසිම දෙයක් බෑනෙ මට... සුද්දි මට ලෝබයි සුද්දි. "කවුරුත් දකින්නෙ නෑ බය වෙන්න එපා" මම දන්නවා සුද්දි මට ආදරෙයි මේ ලෝකෙ මොනවටත් වඩා ... හැබැයි සුද්දි යුතුකම් ඉෂ්ට කරන්න ඕනනෙ නේද?....ම්... අසම්මත වෙලා තුරුල් වෙනවද? සම්මත වෙලා හැමදාම මෙහෙම ඉන්නවද?...ඔව් ඔව් මමනේ අලුතින් මැද්දට ආපු කෙනා නේද?...නෑ නෑ....මට තරහ ගිහින් නෑ.. අනේ මට පුලුවන්ද ගෑණු දරුව එක්ක තරහ ගන්න. තාමත් හැම තප්පරේම ආදරෙයි.

මිනිස්සු අපිව සැක කරනවා ඇති. මට කාටවත් බොරු කරන්න ඕනේ නෑ. හැබැයි මම මේ වෙලාවේ ලෝකෙටම එක බොරුවක් කරනවා. ඔයාට හැර. මම බලාගෙන ඉන්නේ... ඔයා ඔයාගේ පැත්තෙන් හැම දෙයක්ම පැහැදිලිව විසඳගෙන එනකන්. වෙලාවකට හරිම ආත්මාර්ථකාමී විදිහට ඔයාව අයිති කරගන්න හිතෙනවා.. අපි දෙන්නම දන්නවා ආදරයක් නිසා කිසිම මනුස්සයෙක් විනාස වෙන්න හොඳ කියලා. අපි අපිට අයිති වෙලා වටේ ඉන්න හැමෝම විනාස වෙලා වැඩක් නෑ නේ... කවුරුත් වැරදි නෑ සුද්දී... අපි නෙවෙයිනේ සුද්දී මේ ලෝකේ පළවෙනි දෙන්න මේ වගේ නොහිතපු වෙලාවක හම්බුනු. මිනිස්සුන්ට ආදරේ හිතෙන්නේ මහා පුදුම විදිහට නේ... ඒකට කිසිම බාදාවක් පෙන්නේ නෑ. මැරෙනකන් උනත් ඉන්න පුළුවන් සුද්දී ආදරේ කරනවා කියලා දන්න නිසා... එක වචනවලට ගන්න බැරි මහා මොකක්දෝ... අනේ



© 2020 Stages Theatre Group

මන්ද සුද්දී. ඔය දන්නවා ඒක… කැරලි කොණ්ඩෙ, ගොරෝසු අල්ල, දේදුණු පායන ඒ හිනාව... හම්බ්වවෙන්නෙ නැද්ද සුද්දි අපි ආපහු. මේ සේරම ආපහු මුලට යනවනන්. මම සුද්දිව දැක්කෙ නෑ ගොඩ දවසකින්. ගෙවෙන හැම තප්පරේම මතක් වෙනවා... ආදරේ හිතෙනව සුද්දි... කෝ ඔයා ඉන්නවද? ආදරේ කියන්නේ උඹව මතක් වෙනකොටත් මාව පිච්චෙන එකටයි .............

ඉලන්දාරියා.

**කියවීම : අකලංක ප්රභාෂ්වර**



© 2020 Stages Theatre Group

# 10 වන ලිපිය

## මොනවද මම ඔයා වෙනුවෙන් කරේ?

මොනවද මම ඔයා වෙනුවෙන් කරේ.. අපේ යාලුවෝ බහුතරයකට කෙළවෙලා ගියේ ඔය කාලකණ්ණි ප්‍රශ්නේ නිසා.. දැන් අපිටත් ඒකද මේ වෙන්න යන්නේ. මොනවද මම ඔයා වෙනුවෙන් කරේ. මම ඇත්තටම මොකුත් කරලා නෑ. ඇත්තටම බලෙන් මොකුත් කරේ නෑ. ඔයා මගේ ළඟ ඉන්නවා කියලා දන්නවනම් මම මොකටද දේවල් කරන්නේ. ඒ ඒ මොහොතවල්වල වෙන්න තියන දේවල් වුනා. අමාරුවෙන් හරි, ලේසියෙන් හරි. ඉතින් එච්චරයි... මං ඔයා වෙනුවෙන් මොච්චර දේවල් කරලා තියනවා කියලා මතක තියාගෙන ඉඳලා නෑ. මොකද මේක ලිස්ට් එකක් නෙවෙයි නේ. අන්තිමට එකතු කරලා බලන්න.. මම හිතුවේ අපේ සම්බන්දෙ ඒ වගේ තැනක තියන එකක් නෙවෙයි කියලා. ඔයා වෙන කෙනෙක්. ඉතින් ඔයා ඔයාට ඔයා කැමති විදිහට, පහසු විදිහට ඉන්න ඕන. මමත් ඒ වගේමයි. ඒක ඇතුළේ අපි අපිට එකඟ වෙන්න පුළුවන් විදිහට දේවල් කරා. අපි එහෙම තමයි කතා කරගත්තේ. මුලින්ම. අපි හරිම ලස්සනට දේවල් කතා කරලා තියනවා අපේ මුල්ම කාලේ. කාලයත් එක්ක දේවල් වෙනස් වුනා. අපිට අපේ වැඩත් එක්ක දේවල් මඟ ඇරුනා. අපි දැන් ඉස්සර වගේ කතා කරන එක අඩුවෙලා. දැන් දැන් අපි කෑවද.. බිවුවද.. මොකද කරේ.... හොඳින්.. මහන්සියි.. අරක වුනා.. මම මේක කරා.. ඔය වගේ දේවල් විතරයි කතා කරන්නේ. මම හිතන්නේ ඒක ගොඩක් අයට වෙනවා. මං අහලා තිබුනා. ඒක දැන් අපිට වෙලා කියලා දැනෙනවා..

කොහොම වුනත් ඔයා ලියලා තිබුනු ලියුම මම කියෙව්වා. සෑහෙන කාලෙකට පස්සේ ඔයාගෙන් ලියුමක් ලැබුනේ. මට මතක හැටියට සම්බන්දෙ පටන් ගන්න හදන කාලේ ඔයා ලියුමක් දුන්න.. මේ දෙවෙනි එක. ඔයාට යන්න පුළුවන්. ඔයා



© 2020 Stages Theatre Group

ඒක තීරණය කරලා ඉවරයි. තනියම. මොන දේ වුනත් අපි මේ වෙනකන් අපිට වැදගත් කියලා හිතන තීරණ හැම දෙයක්ම තීරණය කරේ කතා කරලා.. ඒක ඇතුළේ අපි දෙන්නටම නිදහස තිබුනා ඕනෑම තීරණයකට යන්න. දැන් ඔයා තීරණය කරලා ඔයාට යන්න ඕන කියලා. හොඳයි.. මං දන්නේ නෑ . කවදද ..? ළඟදි ද..? නැත්තන් තව කොච්චර කාලයක් ඉන්නවද කියන්නවත්. ඉතින් දැන් අපි අපිව විනාස නොවෙන තැනට දේවල් කරගමු. සරලවම කිවුවොත් මම මගේ විදිහට ඉන්නවා. මම හොයන මගේ ගමන. මම ආසම දේවල්. මගේ ලෝකේ මං යනවා. එතකොට තව අවුරුදු 10කින් ඔයා ගියත් අඩුම ගානේ මට මාව විතරක් හරි ඉතුරු වෙයි. පහුගිය කාලේ අපි නිසා මගේ සමහර තීරණ වෙනස් වුනා. තනි තීරණ නොගෙන හිටියා. ඔයත් ඒ වගේම තමයි. මම දන්නවා ඔයත් හොයන ලෝකයක් තියනවා. ඔයා ඒක විශ්වාස කරනවා. ඔයත් ඒ වෙනුවෙන් දේවල් කරන්න. මගෙන් මොනවද වෙන්න ඕන කියලා කියන්න. ආය කවදාවත් අපි අපෙන් අහන්නේ නැතුව ඉමු, ඔයා මොනවද මම වෙනුවෙන් කරේ කියලා. සරලවම කිවුවොත් අපි මේ වෙනකන් අපේ සම්බන්දේ රැකගන්න අවශ්‍ය හැමදේම අපි දෙන්නට දෙන්නා අමාරුවෙන් හෝ ලේසියෙන් කරගත්තා. මං දන්නේ එච්චරයි.

මාව පිච්චෙනවා වගේ දැනෙනවා.
ඇයි අපි දෙන්නත් හැමෝම වගේ මේ ටික කරගත්තේ.
අපි කතා කරමු..?

**කියවීම : පාලිත අබේරත්න**



© 2020 Stages Theatre Group

# 11වන ලිපිය

## Sorry…

## සමාවෙන්න

I'm sorry. That's all I told you. Over and over again.

And you kept saying…

You did this for me, you did that for me … you didn't go there because of me. You didn't do that because of me. You could've been elsewhere if it wasn't for me

WE wouldn't be here if it weren't for me.

Sorry was the right…scratch that… the most appropriate thing to say.

Sorry was the easiest thing to say.

I stood coldly when you broke down, and rested my hand on your shoulder and said I'm sorry. But I wasn't.

It was the right… scratch that… the most appropriate thing to say. It was the easiest thing to say.

I'm not sorry…

That we met

About the three years…

I'm not sorry, about anything…. Hang on a second… Maybe I was sorry. If at all… I was sorry For you. Not sorry that I had done anything I had regretted.

I'm sorry I walked in on you a year later and pretended that everything was suddenly ok. I'm sorry I didn't get straight to the point. I'm sorry I didn't tell you why I was actually there.

I keep visiting and revisiting the memory of you and visiting and revisiting you…

Because…?

No. Not because I was sorry… but because we… you... Never. Said. You. Were. Sorry…

You. Never. Said. You. Were. Sorry…

Something unsaid. Not we. Actually. You.

You left something unsaid.

You. Never. Said. You. Were. Sorry…

For holding me, holding on to me, with your hands, your eyes, your body, your words, your mind.

You. Never. Said. You. Were. Sorry…



© 2020 Stages Theatre Group

For the times you just didn't get it. You. Never. Said. You. Were. Sorry…

You waited… and waited and waited… held, gripped, clasped, had me and finally shoveled your hand inside my guts to draw out *my* 'sorry'. All the sorries that I will ever have to give to you. Maybe that's why I can no longer be sorry.

I'll tell you what I am sorry about though:

I'm sorry that we encounter each other on and off and are able to sit, and talk and laugh and say hello and goodbye and mask everything. I'm sorry that you and I have become *them* now. Those random people we meet. Everyday. Everywhere. Who sit and talk and say hello and goodbye and post #goodtimes on instagram.

I'm sorry we don't address the elephant in the room although it scares us right in the face every time we meet. I'm sorry that there is a space between us.

And by space, I don't mean this coffee table between us.

I'm sorry. That both of us are cowards. I'm sorry that neither of us are ready to accept that it just wasn't working. It wasn't you. It wasn't me. Crap. I'm lying to myself even on paper.

What I meant to say was… I'm sorry that neither of us are willing to accept that both of us were ….

**කියවීම : පියුමි විජේසුන්දර**



© 2020 Stages Theatre Group

## 12 වන ලිපිය

## ප්රශ්න අංක එක

## Problem One

Problem number one is,
How to I start this letter? What do I call him? How do I address him after all this? Hey stranger!  Hey there! Hello darling! Love of my life.

The second problem is,
How to start?  Because starting the letter kind of sets the tone for the rest if the letter. How have you been? What's new? Do you think about me some times? Do you miss me all the time? Me, I'm fantastic. I'm never been better. Yeah, I'm good. I have good days. I have bad days. Some nights I can't sleep. Sometimes it hurts so much I can't breathe.

So the third problem is,
Do I share the good news or the bad news? Do I go for a middle ground between letting him know? Everything in between and letting him know everything is just upside down. So I tried that new restaurant you told me about. Hey I auditioned for a play last week. It's a super script.  But I have a feeling they'd go with someone else. Two nights ago I had a really bad experience with an uber driver on my way home. I'm seeing a counselor.

හතරවෙනි ප්රශ්නේ මම අහනද? නැත්තං එයා කියනකන් ඉන්නද?

Do I frame it as questions? Or do I make statements in my letter? Are you take a great picture lately are you applying for jobs now? Are you seeing someone? If you are seeing someone would you tell me about it? I know you're seeing someone. How come you didn't tell me about that?



© 2020 Stages Theatre Group

One before the last problem,

How do I get that balance between speaking my mind and speaking my heart? You suck! You need help. Professional help. Stop playing games with me. You know you're not seventeen anymore know. You broke me. You know that? You broke me in ways I will never come together again. There are many good options there.

The last problem is,

How to stop the letter? Because closing the letter is as important as the way you start it. You take care, give me a call when you are in town next. Let's get coffee. Please look after yourself. Come back to me… please.

So here's the final draft:

Hey stranger how you been? Me? I'm fantastic. I never been better. So I have tried that restaurant you told me about. You take any good pictures lately?

You take care.

**කියවීම : දිල්රුක්ෂි ෆොන්සේකා**



© 2020 Stages Theatre Group

# 13 වන ලිපිය

## ඇති.. ඇති.. ඇති...

මං මුලින්ම කෙනෙක්ට_ආදරේ කියල කිව්වේ මට වයස අවුරුද 12 දී.. එදා ඉදන් මේ වෙනකං තිබුන සම්බන්දතා.....ඒ මතක.. සමහරක් තැන් හරිම බොළඳයි.. සමහර තැන් සංකීර්ණයි.

කවුරු හරි කෙනෙක් මගෙන් ඇහුවොත් මම වැඩියෙන්ම ආදරේ කරන්නේ කාටද කියලා.....

මම දන්නේ නෑ.. .....

මම දන්නේ නෑ එයා එයාගේ පැත්තෙන් සම්බන්දෙ නවත්තපු දවස..... මම මෙහෙම කිවුවොත් හරි..... කිසිම බලාපොරොත්තුවකින් තොරව මනුස්සයෙකුට ආදරේ කරන්නේ කොහොමද කියලා තේරුම් ගන්න කියලා එයා මාව දාලා ගිහින්.. මගේ ජීවිතේ අනිත්‍ය තේරුම් ගන්න ඉඩ තියලා එයා යන්න ගිහින්.. මම දන්නවා ...

මම ඒ ළමයා වෙනුවෙන් ගොඩාක් ලියන්න ඇති...

බලාගෙන ඉන්න ඇති...

අඬන්න ඇති...

කියවන්න ඇති..

බොන්න ඇති...

හිනාවෙන්න ඇති...

මිනිස්සුන්ට සම්බන්දතාවල ස්වභාවය තේරුම් කරන්න උත්සහ කරන්න ඇති...

කොච්චර දාර්ශනික කතා කිවුවත් ඒ මතකය ඉස්සරහා අන්ත අසරණ වෙන්න ඇති....



© 2020 Stages Theatre Group

එත් මම කවදාවත් එයාට මගේ ළඟට එන්න කියලා කියන්නේ නැත්තේ ඇයි කියලා මම දන්නේ නෑ... මට එයාව මගේ ළඟ තියාගන්න කිසිම දෙයක් බලෙන් කරන්න ඕන උනේ නෑ..

අපි ගැලවෙන්න හදන හැම තැනකදීම  අපි මේක අමාරුවෙන් දරාගෙන ඉන්න උත්සහ කරන්න ඇති. අඬන්න ඇති... රණ්ඩු කරන්න ඇති… sex කරන්න ඇති...
අකමැති දේවල් කැමතියි වගේ කරන්න ඇති...
කට වහගෙන ඉන්න ඇති...
කිසිම හැලහොල්මනක් නැතුව ඔහේ බලාගෙන ඉන්න ඇති...
තේරුම් ගන්න උත්සහ කරන්න ඇති...
තේරුම් කරන්න උත්සහ කරන්න ඇති...
අපි ගැලපෙනවා කියලා හිතන්න උත්සහ කරන්න ඇති...
සිහින මවන්න ඇති...
ඒ සිහින එක එක බොඳවෙනවා බලාගෙන ඉන්න ඇති...
මාත් ඒක්ක අවුරුදු ගානක් එකට ඉන්න ඇති...
කවදාවත් නීති දාන්න නැතුව ඇති...
මම අකමැති, එයා කැමති දේ කරනවා බලාගෙන ඉන්න ඇති...
එයාගේම ගමනක් හොයාගෙන යන්න පොළඹවන්න ඇති...
අපිට දෙන්නට දරාගන්න පුළුවන් ප්‍රමාණයට අපි දෙන්නම පොඩි පොඩි බොරු කියන්න ඇති...
ඒක එයත් මමත් දැනුවත් කියලා අපි දන්නවා ඇති...

ඔයා මට ආදරේ කරනවා කියලා හිතන්න ඇති...
එයාටත් තාම මාව මතක් වෙනවා ඇති...
සමහරක් විට ඔයාට මාව නොගැලපෙන්න ඇති...



© 2020 Stages Theatre Group

ගෙදර අයට මාව නොගැලපෙන්න ඇති...

මම දැනුත් එයා ගැන ලියනවා, කියනවා කියලා එයා දන්නේ නැතුව ඇති...

මට මැරෙන්න හිතුන වාර අනන්තයි අප්‍රමාණයි වෙන්න ඇති...

ඒ හැම වෙලාවකම මම උපරිම සිහියෙන් ඉන්න උත්සහ කරන්න ඇති...

හැම දෙයක්ම අත්හරින්න හිතෙන්න ඇති...

සමහරක් විට මට වැඩියෙන්ම ආදරේ කරපු කෙනා ඔයා වෙන්න ඇති...

එයාව අවිශ්වාස වෙන හැම තැනකදීම එයාව විශ්වාස කරනවා කියලා මං විශ්වාස කරන්න ඇති...

එයා මට මේ ලෝකේ වැඩියෙන්ම බොරු කරපු කෙනා වෙන්න ඇති...

සමහරක් වෙලාවට තනියම බනින්න ඇති...

ඒ කටහඬ තාමත් මට දෝංකාර දෙනවා ඇති...

ලස්සන ඇඳුමක් දකිද්දී තාමත් ඉස්සර වගේ ඒක අරගෙන ගිහින් දෙන්න හිතෙනවා ඇති...

එයා වෙන කට්ටිය එක්ක සතුටු වෙනවා කියලා මට ආරංචි එන්න ඇති...

මේ හැමදෙයක්ම ඇතුළේ මම ජිවිතේ තේරුම් ගන්න ඇති...

මිනිස්සු අල්ලාගෙන ඉන්න සම්බන්දයක් හැම වෙලාවකම හොයනවා කියලා මට ප්‍රත්‍යක්ෂ වෙන්න ඇති...

ඒ තේරුම් ගැනීම අද මම මේ ඉන්න තැනට ගෙන්න උදවු වෙන්න ඇති...

මම කිසිම බාදාවක් නැතුව මිනිසුන්ට ආදරේ කරන්න පුරුදු වුනේ එයාගේන් කියලා එයා දන්නේ නැතුව ඇති...

එයා වගේ පෙනුම තියන අයට මම ආදරෙයි කියලා කියනවා ඇති...

එයා මගේ මුළු ශරීරයම රිදවනවා ඇති...

ආදරය කියන හැඟීම හැම මොහොතකම මාව සුවපත් කරනවා ඇති...



© 2020 Stages Theatre Group

මම කවදාවත් කසාද නොබැඳ ඉන්න ගත්තු තීරණයට එයාලා හැමෝම හේතු වෙන්න ඇති...

මම මේ හැමදෙයකටම එයාට .. ඔයාට.. ඔයාලට .. හැමෝටම ස්තුතිවන්ත වෙනවා ඇති...

මම වෙන ගොඩාක් අයත් එක්ක සම්බන්දතාවලට යන්න ඇති...

එයාට වඩා ගොඩක් හොදයි කියලා හිතෙන අය මට අවංකවම ආදරෙයි කියලා, කියලා ඇති...

ඒ කතා ඇතුළෙත් මම අඩපු තැන් තියෙන්න ඇති...

මාව මේ තරම්ම අවුල් වෙන්න හේතුව ඔයා වෙන්න ඇති...

මේ දැනෙන හැඟීම මොකක්ද කියලා කියාගන්න මේ ලෝකේ වචන ප්රබල මදි කියලා මේ මොහොතෙත් මට හොදටම තේරෙනවා ඇති...

මේ හැම දෙයක්ම ඇතුළේ මම තාමත් ඔයාට ගොඩක් ආදරේ කරනවා කියලා හිතනවා ඇති...........

ඇති.. ඇති...ඇති...

ඇති..

සියල්ලම සිදුවී හමාරයි

ඊළඟට මොකක්ද වෙන්නේ..

මට තේරෙන දේ

ඔයාට ඒ විදිහටම තේරෙන්න ඕනෙම නෑ

ඔයා හිතනවද මේ ඉන්න විදිහ අපිට ඕන විදිහ කියලා?

නෑ...

අපිට ඉන්න ඕන විදිහ මොකක්ද කියලා මිට අවුරුදු දහස් ගානකට කලින් තීරණය කරගෙන එනවා..

අපි කතා කරන්නේ අපිට ඕන භාෂාවද..?



© 2020 Stages Theatre Group

අපි ඉන්නේ අපිට ඕන තැනද?

අපි යන්නේ එන්නේ

ආශ්‍රය කරන්නේ

ගනුදෙනු කරන්නේ

අපිට අවශ්‍ය අයත් එක්කද..

දේවල් එක්කද

ඒ අයත් ගොඩනගපු අය..

ඔයා මම වගේම..

ඉතින් ඒ වගේ ලෝකයක් ඇතුළේ අපි මොනවද හොයන සත්‍ය

මේක ගොඩනගපු ලෝකයක්....

ඒක ගැන හිතලා තියනවද

හැම මොහොතම

හැම දෙයක්ම වෙනස් වෙනවා

ඒක අපිට පෙන්නේ නෑ

හැබැයි අපි පවතිනවා කියලා හිතනවා..

අපි හිතනවා කියලත් හිතනවා

මේ පෙනෙන.. ඇහෙන.. දැනෙන.. මේ සුවඳ.. රස..

සත්‍ය කියලා කියන්නේ කොහොමද.......

මිනිස්සුන්ට අවශ්‍ය ජීවත් වෙන්න

බොරුව..

ඔයා කරන්නේ මොකක්ද කියලා හිතන්න

ඔයා හිතන දේ වෙනවද කියලත් හිතන්න..

ඔයාගේ දුක හෝ සතුට වෙන කෙනෙක් මත තීරණය කරන්න ඉඩ තියන්න එපා..

ඇත්ත තේරුම් ගන්න ගමන්



© 2020 Stages Theatre Group

බොරු කරන්න අමාරුයි..

මම හුස්ම ගන්න පටන් අරගෙන..

මට දැනෙනවා හුස්ම මගේ ඇඟ ඇතුළේ දුවනවා...

මට ඔයා මගේ ළඟ තියාගන්න කිසිම දෙයක් බලෙන් කරන්න ඕන නෑ

මං වෙනුවෙන් කිසිම දෙයක්,

කවදාවත් අකමැත්තෙන් කරන්න එපා...

මං ඔයා වෙනුවෙන්, ඔයාට මාව නැතුව බෑ කියලා හිතෙන තැනටම දේවල් කරලා....

අපි ගැලවෙන්න හදන හැම තැනකදීම

ඔයා මේක අමාරුවෙන් දරාගෙන ඉන්න උත්සහ කරා

ඇඬුවා.. රණ්ඩුකරා.. sex කරා

අකමැති දේවල් කැමතියි වගේ කරා...

කට වහගෙන හිටියා

ලිව්වා

කිසිම හැලහොල්මනක් නැතුව ඔහේ බලාගෙන හිටියා..

තේරුම් ගන්න උත්සහ කරා

තේරුම් කරන්න උත්සහ කරා

අපි ගැලපෙනවා කියලා හිතන්න උත්සහ කරා

ඔයා බලාපොරොත්තු වෙනවා මිට වඩා ඔයාව අල්ලාගෙන ඉන්න සම්බන්දයක්..



© 2020 Stages Theatre Group

ඔයා දන්නවා මම ඔයාගෙන් කිසිම දෙයක් බලාපොරොත්තු නොවී මොනවද බලාපොරොත්තු වෙන්නේ කියලා..

මට පේනවා ඔයාට මහන්සියි.
මගේ පුරුදු ඔයාගේ ශරීරයෙන් පෙන්න අරගෙන..

මම දන්නවා
තනියම ඉද්දි දැනෙන තනිකමට වඩා
මාත් එක්ක ඉද්දි දැනෙන තනිකම ඔයාට දරාගන්න අමාරුයි කියලා.
අද
ඔයයි .. මමයි විතරයි..
ඇත්තටම අද
මම විතරයි.
මමත් නෑ....
මම දන්නවා
ඔයා මාත් එක්ක තරහ නෑ
එත්
ඔයාට මාත් එක්ක තරහයි..
මම ම කියල තියනවා දාර්ශනිකව ආදරය කරන්න බෑ කියලා..

මට මේ සම්බන්දේ නවත්තන්න ඕන..
හැබැයි මේ සම්බන්දය නවත්තන්න ඕන ඔයා...

**කියවීම : ජයම්පති ගුරුගේ**

**නිමි.**


© 2020 Stages Theatre Group

# නිෂ්පාදන කණ්ඩායම

Love and Other Objects ප්‍රථම වරට 2018 නොවැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවේ කොළඹ ගොතේ-ඉන්ස්ටිටියුට් (**Goethe-Institut in Colombo**) හි දී පහත දැක්වෙන නළු නිළියන් සහ කාර්ය මණ්ඩලය සමඟ සිදු කරන ලදී:

| | |
|---|---|
| **රංගනය** | ගිමන්ත වෙලගෙදර |
| | රජිත මධුභාෂ |
| | පැතුම් ධර්මරත්න |
| | අෂාන් ලක්ශාන් |
| | (ආරාධිත රංගනය) නිපුනි ශාරදා |
| | පසිඳු හිරන්‍ය |
| | දුලංජ දිල්ශාන් |
| | අකලංක ජ්රභාෂ්වර |
| | කාංචනා මල්ශානි |
| | පාලිත අබේරත්න |
| | පියුමි විජේසුන්දර |
| | (ආරාධිත රංගනය) |
| | දිල්රුක්ෂි ෆොන්සේකා |
| | ජයම්පති ගුරුගේ |
| **අධ්‍යක්ෂක** | ජයම්පති ගුරුගේ |
| **නිර්මාණ සැලසුම් කරණය සහ** | |
| **සහය අධ්‍යක්ෂක** | රජිත මධුභාෂ |
| **නිෂ්පාදක** | පියුමි විජේසුන්දර |



© 2020 Stages Theatre Group

මෙම පිටපත සැදීමට පහත කලාකරුවන් දායක විය:

| | |
|---|---|
| **පිටපත් රචනය** | ගිමන්ත වෙලගෙදර<br>රජිත මධුභාෂ<br>පැතුම් ධර්මරත්න<br>අෂාන් ලක්ශාන්<br>(ආරාධිත රංගනය) නිපුනි ශාරදා<br>පසිඳු හිරන්‍ය<br>දුලංජ දිල්ශාන්<br>අකලංක ප්රභාෂ්වර<br>කාංචනා මල්ශානි<br>පාලිත අබේරත්න<br>පියුමි විජේසුන්දර<br>(ආරාධිත රංගනය)<br>දිල්රුක්ෂි ෆොන්සේකා<br>ජයම්පති ගුරුගේ |
| **පිටපත් සංස්කරණය** | ජයම්පති ගුරුගේ<br>පියුමි විජේසුන්දර |

මෙම නාට්‍යය පිළිබඳ වඩාත් සවිස්තරාත්මක අවබෝධයක් සඳහා, එය ගොඩනැගුනු ආකාරය පිළිබඳ ඇති අත්දැකීම් , එහි සියලු නිර්මාණ සැලසුම් කරණයට අදාලව විශ්ලේෂණය කිරීම, එහි නිෂ්පාදන වීඩියෝව, හ ඕඩියො පටය, පූර්ව ප්‍රචාරණ කටයුතු, සහ ප්‍රේක්ෂක අදහස් සහ තවත් බොහෝ දේ සඳහා කරුණාකර ස්ටේජස් නාට්‍ය කණ්ඩායමේ (Stages Theatre Group) www.stages.lk හි නිෂ්පාදන පිටුව වෙත පිවිසෙන්න.



© 2020 Stages Theatre Group

© 2020 Stages Theatre Group

stages
theatre
group